# නර්තනය - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# ***හෝමාගම අධ්‍යාපන කලාපය***
# ***ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල***
# ***නර්තනය -10 ශ්‍රේණිය***

නිපුණතාව- 3.0- සාම්ප්‍රදායික වාදන භාණ්ඩ හා විකල්ප වාදන උපකරණ හදුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය

නිපුණතා මට්ටම3.1-නිවැරදි ශිල්පක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි

ක්‍රියාකාරකම- බෙර වාදනයට දෑත හුරු කර ගනිමු.

බෙර වාදනය පිළිබද 9 වන ශ්‍රේණියේදී ඔබ උගත් කරුණු නැවත මතකයට නගා ගනිමු.

## උඩරට ගැටබෙරය

- මහුල් බෙරය ,බණ්ඩි බෙරය යන නම් වලින් හඳුන්වන බව.
- උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාදන භාණ්ඩය බව.
- දිග තුන් වියත් තුන ගුලක් බව./විශ්කම්භය විග්ගුස්සක් බව.




- *බෙර කද සදහා යොදා ගන්න ලී වර්ග,*

1. ඇහැළ
2. කොහොඹ
3. වරකා කොස්
4. ගංසූරිය

වැනි අරටු සහිත ලී යොදන බව.

- *හම් වර්ග,*

දකුණු ඇස

1. වදුරු හම
2. තලගොයි හම
3. එළු හම

වම් ඇසට,

1. මුව හම
2. හරක් හම

- බෙරයේ මැද පිම්බුණු ආකාරයෙන් සාදා ඇත්තේ ධ්වනිය පවත්වා ගැනීමට බවත් ඒ නිසා බණ්ඩි බෙරය නමින් හැදින්වූ බවත් උගත්තෙමු.

- උඩරට බෙරයේ බීජාක්ෂර වාදනය කරමු

තත්

ජිත්

තොං

නං

වම් ඇසින් වාදනය කරන අක්ෂර .

තත්-බෙරයේ මැදට ඇඟිලි පුපුරා යන සේ ගසයි.

තොං-බෙරයේ ගැටියට සුලැගිලි ප්‍රදේශයෙන් ගසයි.

දකුණු ඇසින් වාදනය කරන අක්ෂර.

ජිත්-දකුණු ඇසේ ඉහලට පුපුරා යන සේ ගසයි.

නං-ගැටිය අසලට සුලැගිලි ප්‍රදේශයෙන් ගසයි.

බෙර සරඹ වාදනය.

ආධුනිකයෙකු බෙර වාදනය ඉගෙනීමේ දී වාදනය කල යුතු බෙර සරඹ 12 කි.නිවැරැදිව අක්ෂර වාදනය හුරු කිරීම මෙහි අපේක්ෂාවයි. ඉන් සරඹ දෙකක් මෙම වසරේ දී ඔබ උගත යුතු ය.

1-තකට

2- තකට කුදට

- ත- වම් ඇසට පුපුරා යන සේ
- ක-දකුණු ඇසට සුලැගිලි ප්‍රදේශයෙන්
- ට- දබර ඇඟිල්ල පහතට

●ක,ට අකුරු අත මැණික් කටුව මගින් ජේඅලා වාදනය කරයි.

- කු-බෙරයේ වම් ඇසේ ගැටිය අසලට
- දට-පෙරසේ අත පෙරලා වයයි.

බෙර වාදනයේ මූලික අභ්‍යාස

●තාල පද නිපදවීමේ භාණ්ඩයක් ලෙස බෙරය හඳුන්වයි.

●බෙර වැයීමේ දී පිළිගත් ශබ්දාක්ෂර පුහුණු විය යුතුය.

●ස්වර අක්ෂර හතරකි. උපකාර අක්ෂර 16 කි.ස්වර අක්ෂර බීජාක්ෂර ලෙස ද උපකාරාක්ෂර ගර්භාක්ෂර ලෙස ද හඳුන්වයි .

●මේවා එකතුවෙන් සරල පද නිපදවා ගනිති. එවැනි දක්ෂ බෙර වාදකයෝ ලංකාවේ දක්නට ලැබීම සතුටකි.

**සුළු මැදුම් දෙතිතට බෙර පද වාදනය කරයි.**

තාල තබා කියමින්- මූලික බෙර පදය හා අලංකාර බෙර පදය හුරු කර ගනිමු.

ඉහත සඳහන් පරිදි අක්ෂර බෙරයේ වදින තැන් ගැන අවබෝධයෙන් යුතුව වාදනයට හුරු වෙමු.

නිරන්තර ආභාසයේ යෙදෙමු.

විලම්බ/මධ්‍ය/ද්‍රැත යන ලය තුනට වාදනයට හුරු වෙමු.



# <u>පැවරුම් (1)</u>

(1).ගැට බෙරයේ පැති දෙක ............................ හා........................ ලෙස හඳුන්වයි.

(2).වදුරු හම ................................ ඇසට ද......................... වම් ඇසටද යොදයි.

(3).බෙරයේ ධ්වනිය තීව්‍ර කිරීමට......................... යොදා ඇත්තේ උපක්‍රමශීලී ව ය.

(4).බෙරයේ දිග ............................ වන අතර මුහුනෙහි විෂ්කම්භය ................................කි.

(5).සතර බීජාක්ෂර වාදනයේ දී දකුණු ඇසට...................   ......................... අක්ෂර ද වම් ඇසට

.........................   ......................... අක්ෂර ද වයයි .

කෙටි පිළිතුරු ලියන්න.

(1).තාල නිපදවීමේ භාණ්ඩයක් ලෙස හඳුන්වන්නේ කුමක් ද?

(2).බෙර වාදනයේ දී ස්වර අක්ෂර කීය ද?

(3).ස්වරාක්ෂර හඳුන්වන තවත් නමක් සඳහන් කරන්න.

(4).උපකාරාක්ෂර හඳුන්වන වෙනත් නමක් ලියන්න.

(5).තොං අක්ෂය වාදනයට බෙරයට ගසනු ලබන්නේ කෙසේ ද?